# ග්‍රාමීය බලශක්ති අර්බුදයට විසඳුමක්..................

# දැව භාවිතයෙන් විදුලිය ලබා ගැනීම

**ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මෑතක දී නිකුත් කරන ලද සංඛ්‍යා ලේඛන අනුව ග්‍රාමීය ජනගහනයෙන් 40% ක් පමණ තවදුරටත් විදුලිබලය භාවිතා නො කරයි.** මේ නිසා සිය දෛනික අවශ්‍යතාවන් ඉටු කර ගැනීමේ දී ඔවුන් මහත් අසීරුතාවන්ට පත් ව සිටී. ඊට හේතුව වී ඇත්තේ ගමක හෝ කිසියම් ප්‍රදේශයක ආර්ථික කටයුතු තීරණය වීමේ දී විදුලි බල සැපයුම තීරණාත්මක සාධකයක් වී ඇති නිසාවෙනි. **ගොවියා නිෂ්පාදනය කරන කෘෂි බෝග පාරිභෝජනයට හා වෙළඳ පොළට ගැලපෙන පරිදි සකස් කිරීමේ දී විදුලි බලයෙන් ක්‍රියාත්මක කරනු ලබන යන්ත්‍ර සූත්‍ර වලින් විශාල මෙහෙයක් ඉටු කෙරේ.** එසේම කෘෂි බෝග කල් තබා ගැනීම හා නරක් නොවී තබා ගැනීම සඳහා අවශ්‍ය කරන ශීතාගාර හා ශිතකරණ භාවිතා කිරීම සඳහා ද විදුලි බලය අත්‍යාවශ්‍ය වී තිබේ. මේ නිසා නිදහසෙන් පසු බලයට පත් වූ සෑම රජයක් විසින්ම විශාල මුදලක් වැය කොට ඇති අතර විදුලිබල සැපයුම ස්ථාවර කිරීම සඳහා විකල්ප විදුලිබල යෝජනා ක්‍රම කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කොට ඇති බව දකිය හැකිය.



ඡායා : සී.යූ. සේනානායක

ඉන්ධන දව වගාවක්

විකල්ප බලශක්ති ක්‍රම වශයෙන් කුඩා පරිමාණ ජල විදුලිබල පද්ධති ඇති කිරීම, **ජීව වායුව**, හිරු කිරණ සහ මුහුදු රළ මගින් ඇති කරන විදුලිබල පද්ධති මෙන්ම **දව මගින් ලබා ගන්නා බලශක්ති ක්‍රම** ව්‍යාප්ත කිරීම කෙරෙහි රජය හා රාජ්‍ය නොවන සංවිධාන මගින් මෑත කාලයේ දී විශාල වැඩ කොටසක් සිදු කරමින් සිටී.

**දව වගා බලශක්ති උත්පාදන ක්‍රමය යටතේ අපේක්ෂා කරනු ලබන්නේ විශේෂිත ශාක පද්ධති වගා කොට එමගින් විදුලි බලය උත්පාදනය කිරීමයි. මේ සඳහා විශේෂිත දව වර්ග වශයෙන් වගා කරනු ලබන්නේ ගිරිසීලියා, ඉපිල් - ඉපිල්, ඇකේසියා හා කැලින්ඩරා (Caliendre Calothirus) වැනි ශාක වර්ගයන් වේ.** මෙම ශාක වර්ගයන් ඉතා කෙටි කලක දී වැවෙන අතර, කඳ ඉතා විශාලව නොසෑදේ. සාමාන්‍යයෙන් වර්ෂ 2-5 පමණ කාල සීමාවක දී එළදාව ලබා ගැනීමට ද හැකිය. බලාගාර වලදී දව දහනය කිරීමෙන් විදුලි බලය උත්පාදනය කිරීම මෙමගින් සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා වේ ග්‍රාමීය ජනගහනයෙන් 70% ක් පමණ ප්‍රධාන වශයෙන් ගෘහස්ථ පාරිභෝජනය සඳහා දව භාවිතා කරනු ලැබුවත්, **දව ආශ්‍රයෙන් විදුලිබලය උත්පාදනය කිරීම තවමත් ලංකාවේ පවතින්නේ අත්හදා බැලීමේ මට්ටමකිනි.** ස්කැන්ඩි - නේවියානු රටවල් හා අසල්වැසි ඉන්දියාව වැනි රටවල් දැනට දව ආශ්‍රයෙන් විදුලිබලය නිෂ්පාදනය කොට පාරිභෝගික අවශ්‍යතා

සපුරාගනු ලබයි.

විකල්ප බලශක්ති මූලයක් වශයෙන් දව මහින් විදුලිබලය ලබා ගැනීම වර්තමානයේ ඉතා වැදගත් වන්නකි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදුලිබල උත්පාදක ක්‍රමය වන ජල විදුලි බල මූලය සම්පූර්ණයෙන්ම වාගේ දනට ප්‍රයෝජනයට ගෙන තිබීමත්, තවදුරටත් එමහින් ජල විදුලිබලය නිෂ්පාදනය කිරීම ඉතාම වියදම් සහිත වීමත් ඊට හේතුවයි.

**ඉඩම්, දව වගාවට යෙදවීම ආර්ථික වශයෙන් ලාභදායි නම් පමණක් එවැනි ආයෝජනයක් කළ යුතුය.**

එසේම සූර්ය ශක්තිය හා සුළං ශක්තිය උපයෝගි කර ගනිමින් විදුලිබලය ජනනය කිරීම ඵලදායි විකල්ප කටයුත්තක් වූවත්, සීමාකාරී සාධකයන් පවතින නිසා නැවත උත්පාදනය කළ හැකි බලශක්තීන් හි **(Renewable Energry)** මූලයක් වශයෙන් දව බලශක්තිය සඳහා ලොවෙහි ඉල්ලුම වැඩි වෙමින් පවතී. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාවේ ද දව මහින් විදුලිබලය උත්පාදනය කිරීමේ ඇති හැකියාව සම්බන්ධයෙන් ශක්‍යතා වාර්තා සකස් වෙමින් පවතී. ඒ සමහම **යුරෝපීය ආර්ථික කොමිසමේ ආධාර යටතේ ගස් වැවීම සඳහා නියාමක ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක මට්ටමෙහි පවතී.**

මෙම ලිපියෙන් අපේක්ෂා කරන්නේ (70% ක් පමණ) සුළු ගොවීන් වෙත ශ්‍රී ලංකාවේ දව උපයෝගී කරගෙන විදුලිබලය නිෂ්පාදනය කිරීමට යන්නේ නම් ප්‍රධාන වශයෙන් සලකා බැලිය යුතු සමාජ, ආර්ථික හා ආයතනික කරුණු ස්වල්පයකි. දනට මේ සම්බන්ධයෙන් ආචාර්ය **රේ.විජයවර්ධන** මහතා සහ ඉන්ජිනේරු **පී.ජී. ජෝෂප්** මහතා කර ඇති ශක්‍යතා අධ්‍යයන අනුව හෙක්ටයාර් 400 ක වගාවකින් වියළි දව මෙට්‍රික් ටොන් 25 ක් නිපදවිය හැකි අතර ඉන් මෙගා වොට් 01 ක ධාරිතාවයකින් යුත් විදුලියක් නිපදවිය හැකිය. මෙමහින් විදුලිය සැපයීමේ දී පවුල් 130 කට පමණ රැකියා අවස්ථා ළඟා කර ගත හැකි වේ. මෙහිදී අඛණ්ඩව දව සැපයුම අත්‍යාවශ්‍ය සාධකයකි.

මෙලෙස අඛණ්ඩ දව සැපයුමක් පැවතීමට නම් ඊට යෝග්‍ය වන පරිදි ගස් වගා කළ යුතු වේ. මෙරට ඉඩම් භාවිතය සිදු වී ඇති ආකාරයට තනි වගාවක් ලෙස ගස් වගා කිරීමට ප්‍රමාණවත් ඉඩම් නොමැති බව පෙනී යයි. එසේම ගොවියෙකු වගා කරන සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය අක්කරයකට අඩු මට්ටමක පවතී. එබැවින්, දනට කෘෂිකර්ම හෝ වන වගා සඳහා යොදවා ඇති ඉඩම්, විකල්ප ලෙස දව ඉන්ධන සඳහා යොදවන්නේ නම් එය ආර්ථික වශයෙන් ඵලදායි වන ලෙසට යොදවා ගැනීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුය. එවැනි ක්‍රමයක් හඳුන්වා දීමේ දී අනිවාර්යයෙන්ම දනට ඉඩම් විවිධ බෝග වගාවන් සඳහා යොදවා ගැනීම තුළින් ගොවියා අක්කරයකට/හෙක්ටයාරයකට ලබන ආවස්ථික ආදායම ඇස්තමේන්තු කොට විකල්ප බෝග වගාවන් සඳහා භූමිය යෙදවීමෙන් ලබන ලාභ-අලාභ ගැන තක්සේරුවක් කළ යුතුව තිබේ. එම තක්සේරුවට අනුව **ඉඩම් දව වගාවට යෙදවීම ආර්ථික වශයෙන් ලාභදායි නම් පමණක් එවැනි ආයෝජනයක් කළ යුතුය.** එසේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුව, බොහෝ කෘෂි බෝග වගාවන්ගෙන් ප්‍රමාණවත් ආදායමක් ගොවීන් ට ලැබෙයි.

මේ නිසා, දනට කෘෂි කර්මය යටතේ විවිධ වගාවන් සඳහා භූමිය යෙදවීමෙන් ලබන ආදායමට වඩා ආදායමක් ලබා ගැනීම අපහසු නම් හෝ ආදායම් ලබාගන්නා කාලය වසරකට වඩා වැඩි නම් කළ යුතු වන්නේ දනට වගා කරන ඉඩම්වල අතුරු බෝගයක් ලෙස දව වගා කිරීමයි. නැතහොත් **ප්‍රධාන වන වගා ප්‍රදේශවල අතුරු වගාවන් අරඹා පිරිවැය අවම කිරීමයි.** මේ සම්බන්ධව තීරණ ගැනීමට ප්‍රමාණවත් තොරතුරු නොමැතිකම ගොවීන්ට ගැටළුවක් වේ. එම නිසා තවදුරටත් මේ සම්බන්ධයෙන් සොයා බැලිය යුතුය.

මෙසේ ශ්‍රී ලංකාවේ ඉඩම් භාවිතයේ ආර්ථික වාසි, භුක්ති ක්‍රම හා කෘෂි කාලගුණික තත්ත්වයන් සැලකිල්ලට ගෙන රජය හෝ පෞද්ගලික අංශය මහින් විදුලිබලය ජනනය කිරීම සඳහා **ඉන්ධන දව වගා කිරීමට අපේක්ෂා කරන්නේ නම් සැලකිල්ලට ගත යුතු වගා ක්‍රම හතරක් වේ.**

**දව වගා කිරීමට අපේක්ෂා කරන්නේ නම් සැලකිල්ලට ගත යුතු වගා ක්‍රම කිහිපයකි.**

**I** ප්‍රධාන වාරිමාර්ග ආශ්‍රිත ජනපදවල අතුරු වගාවක් ලෙස හෝ ගිවිසි ගොවිතැන් ක්‍රම අනුව වගා කිරීම. (මේ යටතේ **මහවැලි, ගල්ඔය, ගිරිතලේ, ලුණුගම්වෙහෙර** වැනි ජනපදවාසීන් සැලකිල්ලට ගත හැකිය.)

**II**. තේ සහ රබර් වතු ආශ්‍රයෙන් අතුරු වගාවක් ලෙස වගා කිරීම.

**III**. භාවිතයට නොගත් රජයේ වන රක්ෂිත, ප්‍රජා වන වගා ක්‍රමය යටතේ වගාවට යෙදවීම.

**IV** රජය සතු වගා නොකළ ඉඩම් දීර්ඝ කාලීන බදු සහන යටතේ වගා කිරීමට පෞද්ගලික ගොවීන්ට පැවරීම

**දව වගාව ව්‍යාප්ත කිරීමේදී සැලකිල්ලට ගත යුතු අනෙකුත් කරුණු වන්නේ සමාජ සහ ආයතනික කරුණු වේ. එනම්, විකල්ප නව ඉන්ධන මූලයක් වශයෙන් දව විදුලිය ලබා ගැනීම සම්බන්ධව ජනතාව දැනුවත් කිරීමයි.** පරිසර හිතකාමී බල උත්පාදන ක්‍රමයක් වශයෙන් දව වගා කොට ක්‍රමානුකූල ලෙස ඒවා කපා භාවිතා කිරීම ගැන, දැනුවත් කිරීම මෙහි දී වැදගත් වේ.

**වාණිජ ව්‍යාපෘතියක් වශයෙන් දව බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නේ නම් ඒ සඳහා සංවිධානාත්මක ආයතනික රටාවක් පැවතිය යුතුය.** විදුලිබලය නිෂ්පාදනය කරන සමාගම හෝ ආයතනය සමග දව මිලදී ගැනීම හා ප්‍රවාහනය වැනි කරුණු සම්බන්ධයෙන් ගිවිසුම් ගත වැඩ පිළිවෙලක් තිබීම අවශ්‍යය. එසේම, **විදුලිබල පද්ධති පාලනය, විදුලිය සහ මිල ගණන් අය කිරීම නඩත්තුව වැනි කරුණු සම්බන්ධව ද පැහැදිලි ප්‍රතිපත්තියක් හා ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් පැවතිය යුතු වේ. විදුලිබල සැපයුම සඳහා රාජ්‍ය ආයතනයක් සම්බන්ධයෙන් වුවද දව සැපයුම හා මිලදී ගැනීම සම්බන්ධව පැහැදිලි ප්‍රතිපත්ති-යක් තිබීම අවශ්‍යය.**

**විදුලිබල සැපයුම සඳහා රාජ්‍ය ආයතනයක් සම්බන්ධයෙන් වුවද දව සැපයුම හා මිලදී ගැනීම සම්බන්ධව පැහැදිලි ප්‍රතිපත්ති-යක් තිබීම අවශ්‍යය.**

**ජී.එම්. හේනේගෙදර**

**අංශ ප්‍රධාන**
**කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීමේ අංශය**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖

## "ගොවි ජනතා"

**"ගොවි ජනතා"** සඟරාව පිළිබඳව ඔබ දක්වන අදහස් හා ප්‍රතිචාර අපි ඉතා අගය කොට සලකමු. එසේම ඒවා ඉදිරි කලාපයන් හි පල කිරීමට ද කටයුතු කෙරේ. එබැවින්, එවැනි ද, සංස්කාරක වෙත දන්වා එවන ලෙසට පාඨක ඔබට ආරාධනා කරමු.

**සංස්කාරක**
**ගොවි ජනතා**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා**
**පුහුණු කිරීමේ ආයතනය**
**අංක 114,**
**විජේරාම මාවත,**
**කොළඹ 07.**